# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ඇබෑර්තු

තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ

## 01. නේවාසික ඉංජිනේරු

**රැකියා විස්තරය**

සියලුම සිවිල්, විදුලිමය හා යාන්ත්‍රික වැඩවල සමස්ත සැලසුම් සකස් කිරීම, ඇස්තමේන්තු කටයුතු, ඉදිකිරීම්, නඩත්තු හා නිර්මාණ කටයුතු ඉටු කිරීමේ වගකීම දරයි.

**බාහිර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (සිවිල්) ප්‍රථම උපාධියක්,

සහ

වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

හෝ

ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව (NDT) හෝ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) සමග, රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සිවිල් ඉංජිනේරු කාර්යයන්හි, සුදුසුකම් ලැබීමෙන් පසු වසර අටක (08) පළපුරුද්ද.

**අභ්‍යන්තර :**

කණිෂ්ඨ කළමනාකරු සේවා ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර (සිවිල්) 1 ශ්‍රේණියේ අවම වසර පහක (05) සතුටුදායක සේවාවක්.

**වැටුප් පරිමාණය :**

MM 1-2 (2016) රුපියල් 54,550/- 10 x 1,375 - 15 x 1,910 - රුපියල් 96,950/- (මසකට)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන)

**රැකියා විස්තරය**

කළමනාකරණ කාමි පර්යේෂණ සංවර්ධන කටයුතු වැඩ හා තාක්ෂණික වැඩ සඳහා පහසුකම් සැපයීම, සහායවීමට අදාළ වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

**බාහිර :**

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, විද්‍යා ධාරාවෙන්, එක් වරකදී විෂයයන් තුනකින් (03) සමත් වීම හා අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරකදී ගණිතය, විද්‍යාව හා භාෂාව (සිංහල / දෙමළ හා ඉංග්‍රීසි) ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම,

සමග

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් NVQ සුදුසුකම් 5 මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) ඩිප්ලෝමාවක්.

**අභ්‍යන්තර :**

බාහිර අයදුම්කරුවන් ගේ සුදුසුකම් වේ.

**වැටුප් පරිමාණය :**

MA 2-2 (2016) රුපියල් 30,310 - 10 x 300 - 7 x 350 - 4 x 600 - 20 x 710 - රුපියල් 52,360/- (මසකට)

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම උපරිම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

❖ 2019 ජුනි 16 දින පළකරන ලද පුවත්පත් දැන්වීමෙහි සඳහන් වූ පරිදි තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

i. නවාතැන් පහසුකම් (සම්පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස / නේවාසිකාගාර කාමර), ඇතොත් ලබාදෙනු ලබන අතර, එසේ නොමැතිනම් නවාතැන් පහසුකම් වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

ii. ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයෙහි පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

iii. ආයතනයේ මාර්ගෝපදේශ ප්‍රකාරව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලයේ ප්‍රවාහන පහසුකම් සැපයේ.

v. සේවක අර්ථ සාධක අරමුදල : තෝරාගත් අයදුම්කරුවන් විසින්, තම වැටුපෙන්, කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලට 10% කින් දායක විය යුතු අතර, ආයතනය විසින් 15% ක දායකත්වයක් එයට දරනු ඇත. තවද, ආයතනය විසින් සේවා නියුක්ති භාර අරමුදලට 3% ක් වශයෙන් දායක වනු ඇත.

vi. තේ පර්යේෂණ ආයතනයේ සේවකයන් සඳහා අදාළ වන අනෙකුත් ආන්තික ප්‍රතිලාභද හිමිවේ.

මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. අයදුම්පත්, අයදුම්කරුගේ ජීව දත්ත, සම්පූර්ණ තොරතුරු සමග උප්පැන්න සහතිකය, අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල සහතිකවල පිටපත්, සේවා සහතික පිටපත් හා අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම ඇගයුම් කිරීම සඳහා කරුණු විමසිය හැකි ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් අත්සන් තබා ඇති අය වෙත 2020 ඔක්තෝබර් 26 වන දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු නිලධාරීන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ලැබීමට සැලැස්විය යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන ලෙස අයදුම්පත් එවීම ඒවා ප්‍රතික්ෂේප වීමට හේතුවනු ඇත. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

කරුණාකර, අවශ්‍ය තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමු වන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කුම්බ්ස්, තලවකැලේ.**